2018 වසරේ ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය 3.2%යි

2017 වසරේ දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනයට සාපේක්ෂව පහළ යෑමක්

ආර්ථික කටයුතුවල මධ්‍යස්ථ වර්ධනය නිසා සේවා වියුක්තිය ඉහළ යෑමක්

ඉතිහාසයේ ප්‍රථම වතාවට වෙළෙඳ හිඟය ඩොලර් බිලියන 10 ඉක්මවීමක්

2018 වසරේ මෙතෙක් චාර්තාවූ ඉහළම විදේශීය සෘජු ආයෝජන මට්ටමක්

වසර තුළ මතුපිට හා මූලික උද්ධමනය තනි අඩු අගයක හිතකර පැවතීමක්

රජයේ නොපියවූ ණය ද.දේ.නි.යේ ප්‍රතිශතයක් ලෙස 82.9%ට ඉහළ යෑමක්

අත්‍යවශ්‍ය වනුහාත්මක ප්‍රතිසංස්කරණ ප්‍රමාදවීම ශ්‍රී ලංකාවේ ආර්ථිකය මන්දගාමී වර්ධන මාවතකට පිවිසීමට හේතුවක්

මේ තත්ත්වය තුළ ශ්‍රී ලංකා ආර්ථිකය, ගෝලීය සහ දේශීය බාධාවන්ට ලක්වීමේ වැඩි අවදානමක් ඇති බව ශ්‍රී ලංකා මහ බැංකුව කියයි

■ සමිල පෙරේරා

2018 වර්ෂයේ ශ්‍රී ලංකාවේ මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ (ද.දේ.නි.) වර්ධනය 3.2%ක අගයක් හෙවත් දැනට පවතින ඇස්තමේන්තු අනුව 3.4%ක අගයට සාපේක්ෂව ආර්ථික වර්ධනයේ පහළ යෑමක් පෙන්නුම් කරන බව මහ බැංකුවේ 2018 වසරේ වාර්ෂික වාර්තාවෙන් ශ්‍රී ලංකාවේ ආර්ථිකය පිළිබඳ මෙම කරුණු සඳහන් වෙයි.

ප්‍රධාන වශයෙන් ඉදිකිරීම් කටයුතුවල පසුබෑමක්

ශ්‍රී ලංකා මහ බැංකුව පෙන්වා දෙන්නේ, 2018 වර්ෂයේ පහළ උද්ධමනකාරී වාතාවරණයක් මධ්‍යයේ සාමාන්‍ය වර්ධනයක් වාර්තා කළ ශ්‍රී ලංකා ආර්ථිකය, කාර්මික සහ දේශීය බාධාවන්ට ලක්වීමේ අවදානම් සහගත බව වැඩි වශයෙන් පිළිබිඹු කර ඇති බවය. 2018 වර්ෂයේදී මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය පසුගිය වසරේ වාර්තා කළ 3.4%ට සාපේක්ෂව 3.2%ක අගයක් වාර්තා කර ඇති බවත්, දේව අංශයේ ශ්‍රීධාරණ කටයුතු හැරුණු සිදු වූ 4.7%ක වර්ධනය සහ බහිෂ්කාර්මික කටයුතු ගණනාවක්හිදියටත් පැන්නෙමින් එම අංශයේ වාර්තා කළ 4.8%ක වර්ධනය මේ සඳහා වැඩි දායකත්වයක් සපයා ඇති බවත් පෙන්වයි. කෙසේ වෙතත්, ප්‍රධාන වශයෙන් ඉදිකිරීම් කටයුතුවල පසුබෑමක් හේතු කොටගෙන වසර තුළදී කාර්මික අංශයේ වර්ධනය 0.9%ක් දක්වා සැලකිය යුතු ලෙස හීනවැටුමක් වූ බව පෙන්වා සිටින මහ බැංකුව, ද දේ නි ගණනය කිරීමේ විධිවලින් ප්‍රතිඵලය අනුව, පරිමාණ විශාල විසඳුම් සහ අඛණ්ඩ වියදම් යන දෙකෙහිම 2018 වර්ෂය ආර්ථික වර්ධනය සඳහා දායක වූ බවද කියයි.

2018 ශ්‍රී ලංකා ආර්ථිකය ඩොලර් බිලියන 88.9ක

ද.දේ.නි යෙහි ප්‍රතිශතයක් ලෙස ආයෝජන පෙට වසරේ වාර්තා කළ 28.8%ට සාපේක්ෂව 28.6%ක් ලෙස පැවතුණු බවත්, ඉතුරුම්-ආයෝජන පරතරය වසර තුළදී තවදුරටත් පුළුල් වූයේ විශි හිඟය සපුරා ගැනීම සඳහා විදේශීය සම්පත් මහ වූ රැඳියාව ඉහළ යෑම පිළිබිඹු කරමින් බවත් මහ බැංකුව පවසයි. 2018 වසරේදී ශ්‍රී ලංකා ආර්ථිකය ඒ ඒ ඩොලර් බිලියන 88.9ක් අභිහකර තත්ත්වයන් යම්කාර් පුරකට සමානයවීමෙන් 2018 වසර අවසානයේදී සහ 2019 වසර ආරම්භයේදී ගෙවුම් තුලනය සහ විනිමය අනුපාතිකය මත ඇති වූ පීඩනය පහළ ගිය බවද මහ බැංකුව පවසයි.

ආහාර බොහෝමයක මිල ගණන් පහළ යෑමක්

මහා ඉදිරි දැක්මකින් යුතුව ක්‍රියාත්මක කළ මුදල් ප්‍රතිපත්තිය, දේශීය අංශයේ සැපයුම් තත්ත්වය ඉහළ යෑම මෙන්ම සම්භාර ඉල්ලුම් අඩු මට්ටමක පවතින්න හේතුවෙන් උද්ඵිරණයනුදු සිදු වූ අධික අවප්‍රමාණය සහ ගැඹිය ධාරිත් අතල් මිල ස්ථාවර කිරීම් සඳහා මිල සූත්‍රයක් හඳුන්වා දීම් පනුවේ වුවද වසර තුළදී තවදුරටත් මූලික උද්ධමනය 2018 වසරේදී 0.6%ක අතිරික්තයක් වාර්තා කළ බවත් මහ බැංකුව පවසයි. එහිදී, ප්‍රාග්වන විදුම්වල සැලකිය යුතු පහළ යෑම් හේතුවෙන් අයවිය හිඟය ද.දේ.නි යෙහි ප්‍රතිශතයක් ලෙස 2017 වසරේදී පැවැති 5.5% සිට 2018 වසරේදී 5.3% දක්වා අඩු වූවද, 2018 අයවැයට අනුව අපේක්ෂිත ඉලක්කය වූ 4.8%ක මට්ටම ළඟා කරගැනීමට නොහැකි වූ බව මහ බැංකුව පවසයි.

රජයේ ණය වැඩි වීමට රුචියල අවප්‍රමාණයත් හේතුවක්

මධ්‍යම රජයේ නොපියවූ ණය, 2017 වසර අවසානයට ද.දේ.නි යෙහි ප්‍රතිශතයක් ලෙස පැවැති 76.9% සිට 2018 වසර අවසානය වනවිට 82.9% දක්වා ඉහළ ගොස් ඇති බව මහ බැංකුව පෙන්වා දෙයි. මේ සඳහා ප්‍රධාන වශයෙන් බලපෑ හේතු වූයේ ඉහළ ප්‍රාථමික හිඟයක් සහ රුපියලේ අවප්‍රමාණය බවත් මහ බැංකුව පවසයි.

මහ බැංකුවේ 2018 වසරේ වාර්ෂික වාර්තාව මුදල් ඇමතිට පිළිගැන්වීම

බැංකු හා බැංකු නොවන මූල්‍ය ආයතනවල තැන්පතු පොලී පහත හෙළීමට ක්‍රියාමාර්ග

- ණය ලබාදීමේදී අධික පොලී අනුපාත අය කිරීම සහ තැන්පතු සඳහා ඉතා ඉහළ පොලී අනුපාත ලබාදීම නිරීක්ෂණය කරමින් මහ බැංකුව මෙම ක්‍රියාමාර්ග ගනියි

- මෙමගින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් වෙත ණය සැපයීම් යොමු කරවීම මහ බැංකුවේ අපේක්ෂාවයි

■ සමිල පෙරේරා

බලපතලාභී බැංකු හා බැංකු නොවන මූල්‍ය ආයතන විසින් තැන්පතු සඳහා ලබාදෙනු ලබන පොලී අනුපාත පහත දමන ලෙසට ශ්‍රී ලංකා මහ බැංකුව ඉල්ලීමක් කරයි.

ණය අනුපාත පහත දැමීම මගින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් වෙත ණය සැපයීම් යොමු කරවීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මෙම ක්‍රියාමාර්ග ගෙන තිබේ. මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කළ නිවේදනයේ වැසිදුරටත් දැක්වෙන්නේ මෙසේය.

"මෙවෙලෙද පොළ ප්‍රවණතා වර්ධනය කිරීම සඳහා ව්‍යවස්ථාපිත සංවිත අනුපාතය පහත පෙළීම සහ එක් දින පොලී අනුපාතික අඩු කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැබෙගෙන තිබියදී, බලපතලාභී බැංකු හා බැංකු නොවන මූල්‍ය ආයතන මගින් ණය ලබාදීමේදී, අධික පොලී අනුපාත අය කිරීම සහ තැන්පතු සඳහා ඉතා ඉහළ පොලී අනුපාත ලබාදීම් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිරීක්ෂණය කර ඇත.

විශේෂයෙන්ම, මහා ලෙස පැවසය කරන ලද උද්ධමනයක් හා උද්ධමන අපේක්ෂාවක් පවත්වා ගෙන යනු ලබන වටපිටාවක් තුළ, ශ්‍රී ලංකාවේ මූර්ත පොලී අනුපාත කැලපාරේ අහෙකුත් ආර්ථිකයන් හා සසඳීමේදී අධිකව පවතින බව පෙනී යන කරුණකි.

ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපතලාභී බැංකු හා බැංකු නොවන මූල්‍ය ආයතන විසින් තැන්පතු සඳහා ලබාදෙනු ලබන පොලී අනුපාත පහත දමන ලෙසට ඉල්ලීමක් කරන ලද අතර, එමගින් මූල්‍ය අංශ හරහා මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණය කාර්යක්ෂම කිරීමට සහ ඒ අනුව, බලපතලාභී බැංකු විසින් විශේෂයෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට හා පෞද්ගලික ණය ලබාදීමේදී අය කරන පොලී අනුපාත පහත ඉහළ නැංවීමට අපේක්ෂා කෙරේ.

බලපතලාභී බැංකු හා බැංකු නොවන මූල්‍ය ආයතන මගින් ඉහිරි කිරීමේ සහ මාස 3 ට අඩු අණකුත් තැන්පතු සඳහා ලබාදෙන පොලී අනුපාත පහත දමන ලෙසට ශ්‍රී ලංකා මහ බැංකුව ඉල්ලීමක් කරයි.

මෙම ක්‍රියාමාර්ග ගෙන තිබියදී, බැංකු නොවන මූල්‍ය ආයතන විසින් තීරුවෑ කැලපාරේ අහෙකුත් ණය ලබාදීමේදී, අධික පොලී අනුපාත අය කිරීම සහ තැන්පතු සඳහා ඉතා ඉහළ පොලී අනුපාත ලබාදීම් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිරීක්ෂණය කර ඇත.

විශේෂයෙන්ම, මහා ලෙස පැවසය කරන ලද උද්ධමනයක් හා උද්ධමන අපේක්ෂාවක් පවත්වා ගෙන යනු ලබන වටපිටාවක් තුළ, ශ්‍රී ලංකාවේ මූර්ත පොලී අනුපාත කැලපාරේ අහෙකුත් ආර්ථිකයන් හා සසඳීමේදී අධිකව පවතින බව පෙනී යන කරුණකි.

ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපතලාභී බැංකු හා බැංකු නොවන මූල්‍ය ආයතන විසින් තැන්පතු සඳහා ලබාදෙනු ලබන පොලී අනුපාත පහත දමන ලෙසට ඉල්ලීමක් කරන ලද අතර, එමගින් මූල්‍ය අංශ හරහා මුදල් ප්‍රතිපත්ති සම්ප්‍රේෂණය කාර්යක්ෂම කිරීමට සහ ඒ අනුව, බලපතලාභී බැංකු විසින් විශේෂයෙන් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවලට හා පෞද්ගලික ණය ලබාදීමේදී අය කරන පොලී අනුපාත පහත ඉහළ නැංවීමට අපේක්ෂා කෙරේ.

බලපතලාභී බැංකු හා බැංකු නොවන මූල්‍ය ආයතන මගින් ඉහිරි කිරීමේ සහ මාස 3 ට අඩු අණකුත් තැන්පතු සඳහා ලබාදෙනු ලබන අධික පිරිවැය අඩු වන අතර, එයට වඩා වැඩි කාලසීමාවකින් යුතු තැන්පතු සඳහා පොලී අනුපාත දින 364 භාණ්ඩාගාර බිල්පත් අනුපාතය මත පදනම් වනු ඇත. වයස අවුරුදු 18 ට අඩු ළමයින් සඳහා වන ඉහිරි කිරීමේ ගිණුම් සහ පේෂක්ර පුරවැසියන්ගේ විසරකට හෝ ඊට වැඩි කාලසීමාවකින් යුතු ස්ථිර තැන්පතු සඳහා පදනම් අංක 50ක් (50 basis points) දක්වා අතිරේක පොලියක් ලබාදීමට බැංකු හා බැංකු නොවන මූල්‍ය ආයතනවලට හැකියාවක් ඇත. මේසට අතහරින්, බැංකු නොවන මූල්‍ය ආයතන විසින් නිකුත් කරනු ලබන ණය උපයාරණ සඳහාදු උපරිම පොලී අනුපාත සීමාවන් අදාළ නෑ. මෙයි ක්‍රියාමාර්ග ගන්නා අතරතුර තැන්පතුකරුවන්ට සැලකිය යුතු මූර්ත ප්‍රතිලාභයක් ලැබෙන පරිදි තැන්පතු පොලී අනුපාත තරගකාරීව පවත්වා ගෙන යනු ඇතැයි අපේක්ෂා කෙරේ.

ඉහත ක්‍රියාමාර්ග මගින් මූල්‍ය අංශය විසින් අරමුදල් වෙනුවෙන් දරනු ලබන අධික පිරිවැය අඩු වන අතර, ඉදිරි කෙටි කාලය තුළදී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ලබාදෙන ණය සඳහා වන පොලී අනුපාත පදනම් අංක 200කින් (200 basis points) පහත හෙළන ලද අතර, එමගින් මේ වනවිටත් අරමුදල් සඳහා දැඩිය යුතු පිරිවැය අඩු වී ඇත. එමගින් තැන්පතු හා ණය පොලී අනුපාත අතර පරතරය අඩු වෙනවැයි අපේක්ෂිතය. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බැංකු හා බැංකු නොවන මූල්‍ය ආයතන තැන්පතු හා ණය පොලී අනුපාතිකයන්ගේ තැන්පතු හා [illegible] නිරීක්ෂණය කරනු ඇතැ අතර, අනාගතයේදී